*සැ. යු.*- 2019.08.09 දින පළ වූ අංක 2,136 දරන *ගැසට් පත්‍රයේ* II කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,137 - 2019 අගෝස්තු මස 16 වැනි සිකුරාදා - 2019.08.16**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | — |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 454 |


*සැ. යු.* - (i) දේශීය භාර ලදුපත් (සංශෝධන) පනත් කෙටුම්පත 2019 අගෝස්තු මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) කල්බදු මූල්‍යකරණ (සංශෝධන) පනත් කෙටුම්පත 2019 අගෝස්තු මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2019 සැප්තැම්බර් මස 06 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 අගෝස්තු මස 23 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# විවිධ දැන්වීම්

**(සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින්) කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය**

| | | |
|---|---|---|
| නඩු අංකය | : | HC/CIVIL/51/2019/CO |
| ස්වභාවය | : | ගණන් බේරා වසා දැමීම |
| ක්‍රියාපටිපාටිය | : | ලඝු |
| වටිනාකම | : | රු. 56,559,000 |

2007 අංක 7 දරන සමාගම් පනතෙහි 270 (ඉ) හා (ඊ) සමග කියවෙන 271 (අ) යන වගන්ති ප්‍රකාරව ලියාපදිංචි කාර්යාලය, කොළඹ 03, ගාලු පාර, අංක 134 හි පිහිටි සේරක ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් (PB 879) අධිකරණය විසින් ගණන් බේරා වසා දැමීම සම්බන්ධව කරන ඉල්ලීමකි.

එස්එම්බී ලීසිං පීඑල්සී,
අංක 282/1, සීබීඑස් ගොඩනැගිල්ල,
ගාලු පාර, කොළඹ 03.

............................*පෙත්සම්කරු.*

බස්නාහිර පළාත්බද කොළඹ දී පවත්වන මහාධිකරණය (සිවිල් මහාධිකරණය) විසින් ඉහත නම සඳහන් සමාගම ගණන් බේරා වසා දමනු ලැබීම සඳහා කොළඹ 03, ගාලු පාර, සීබීඑස් ගොඩනැගිල්ල, අංක 282/1 හි එස්එම්බී ලීසිං පීඑල්සී විසින් 2019ක් වූ ජූලි මස 04 වැනි දින එකී අධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කරනු ලැබූ බවත්, එකී පෙත්සම 2019ක් වූ සැප්තැම්බර් මස 17 වැනි දින අධිකරණය ඉදිරියේ විමසීම සඳහා නියම කරනු ලැබූ බවත්, එකී පෙත්සමේ පිටපතක් අවශ්‍ය සමාගමේ කවර හෝ ණයහිමියෙකුට හෝ දායකයෙකුට නියමිත ගාස්තු ගෙවීම මත, පහත අත්සන් කරනු ලබන අය විසින් එය සපයනු ලබන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

*අත්සන් කළේ* :- පෝල් රත්නායක ඇසෝසියේට්ස්,
නීතිඥවරු,
59, ග්‍රෙගරී පාර,
කොළඹ 07.

*සටහන.-* එකී පෙත්සම සම්බන්ධව විමසීමේ දී පෙනී සිටීමට අදහස් කරන කවර හෝ පුද්ගලයෙකු, එසේ කිරීමට ඇති සිය අදහස ඉහත නම සඳහන් නීතිඥවරුන් වන පෝල් රත්නායක ඇසෝසියේට්ස් සමාගමට 1939 සමාගම් ගණන් බේරා වසා දැමීමේ රීතිවල දක්වා ඇති අංක 9 ආකෘතියට අනුකූලව සැකසූ ලිඛිත දැන්වීමක් බාරදිය යුතුය. *නැතහොත්* තැපෑලෙන් එවිය යුතුය. දැනුම් දීම කරන පුද්ගලයාගේ නම හා ලිපිනය ද, සමාගමක් නම් සමාගමේ නම හා ලිපිනය, ණය හිමියෙකු නම් අයවිය යුතු ණය මුදල ද, දායකයෙකු නම් තමන්ට හිමි සමාගමේ කොටස් සංඛ්‍යාව ද, දැන්වීමේ ප්‍රකාශ කළයුතු අතර, පුද්ගලයා හෝ සමාගම විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ නීතිඥවරයෙක් සිටී නම් නීතිඥවරයා/වරිය විසින් අත්සන් කළ යුතු අතර, වර්ෂ 2019ක් වූ සැප්තැම්බර් මස 16 වැනි දින පස්වරු 6.00 ට පෙර බාරදිය යුතු ය. *නැතහොත්,* තැපැල් මගින් එවන්නේ නම්, ඉහත සඳහන් දිනට පෙර, ඉහත නම සඳහන් නීතිඥවරුන්ට ලැබෙන ලෙස තැපැල් මගින් එවිය යුතුය.

08-646

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.